# මූල බ්‍රාහ්මී ශිලාලේඛනවල පෙනෙන පරුමක හා පරුමකලු යන වදන් පිළිබඳ විමර්ශනයක්

ගල්වැවේ විමලඛන්ති හිමි

Early *brahmí* inscriptions appear in caves in Sri Lanka mentioned a lot amount of *parumaks* and several *Parumakalus* as doners or co doners. These words appear within approximately covering a period of four centuries (3rd century B.C. to 1st half of 1st century A.D.). At amount of 334 inscriptions out of around 1500, appear this tittle and it bears some kind of power in the society at that time. Some scholars believe that the word comes from *pramuka* in Sanskrit or *pamuka* in Pali language while others explained it as *pāmokkha* which means the great leader appear in Pali and Sanskrit literature. The word *parumaka* appears in every part of the island and it persuades us to think its power and the intervention of the ruling authority. The significance and the intensity of the 'historical problem' concerning the *parumaka* is reflected in the wide range of views expressing their antecedents, functional role, and the qualitative status of this group within the socio-political structure of the early history of Sri Lanka. In this article available all findings and explanations of primary researchers about the matter were discussed and pointed out the most reliable meaning of the word.

## හැඳින්වීම

මූල බ්‍රාහ්මී ශිලාලේඛන රාශියක ම ''**පරුමක**'' යන වදන හමුවන අතර එය යම් බලාත්මක නිලයක් වශයෙන් තත් සමාජයෙහි ක්‍රියාත්මක වූ බව විමර්ශනයේදී තහවුරු වේ. එහෙත් එම නිලය පැමිණියේ කෙසේ ද එම නිලයට අයත් කාර්යයන්

කවරේ ද යන්න පිළිබඳ විමර්ශනයක් සිදු කිරීම එක් දහස් පන්සියයක් තරම් වූ (1500) මූල බ්‍රාහ්මී ශිලාලේඛන පරීක්ෂා කිරීමේදී අත්‍යවශ්‍ය කටයුත්තක් වශයෙන් දිස්වේ. එලෙස විමර්ශනය කිරීම හා එහි සමාජ බලාත්මකභාවය පැහැදිලි කර ගැනීමට මේ තුළින් අපේක්ෂා කෙරේ.

## පර්යේෂණ ක්‍රමවේදය

මේ සඳහා භාවිත කෙරෙන පර්යේෂණ ක්‍රවේදය වන්නේ ''**ග්‍රන්ථ සන්ධාර පර්යේෂණ ක්‍රමවේදය**'' යි. උක්ත ප්‍රස්තුතය පිළිබඳව මූල බ්‍රාහ්මී ශිලාලේඛන පරීක්ෂා කළ හා ඒවා අර්ථ නිරූපණය කළ උගතුන් රාශියක් ම විවිධ අවස්ථාවල විවිධ අර්ථකථන එළි දක්වා තිබේ. ඒ අතරත සාමූහික පිළිගැනීමක් මේ දක්වා සිදුවී නොමැත. එකී පර්යේෂණ හා අර්ථ දැක්වීම් පිළිබඳව සන්වේදී වෙමින් එම පරුමක නම් නිලයෙන් අදහස් කළේ කුමක්දැ යි වටහා ගැනීමට මෙම පර්යේෂණ ක්‍රමවේදය ප්‍රමාණාත්මක වන බැවින් එය භාවිත කරන ලදි. මූල බ්‍රාහ්මී ශිලාලේඛනවලින් අති බහුතරයක් මේ වන විට ප්‍රකාශයට පත්ව ඇති බැවින් ක්ෂේත්‍ර පර්යේෂණ විධික්‍රමය භාවිතයට ගැනීමේ අවශ්‍යතාවයක් මතු නොවේ.

## සාකච්ඡාව

**පරුමක** හා **පරුමකලු** යන වදන් දෙක එකම පරිපාලන තනතුරු දෙකකි. ඒවා පුරුෂ හා ස්ත්‍රී ලිංගාර්ථයන්ගෙන් යෙදී තිබේ. පරුමක යනු පුරුෂ ලිංගාර්ථයෙහි ද පරුමකලු යනු ස්ත්‍රී ලිංගාර්ථයෙහි ද වැටේ. මෙයින් පරුමක යන වදන සංස්කෘත භාෂාවේ ''**මහාප්‍රමුඛ**'' යන වදනින් ද පාලි භාෂාවේ ''**පාමොක්ඛ/පමුඛ**'' හෝ ''**මහාපාමොක්ඛ**'' යන වදන්වලින් බිඳී ආවක් බව පරණවිතාන පෙන්වා දෙයි.[1] එම වදන රාජකීය සම්භවයක් සහිතව නවවන (09) සියවස දක්වා ම භාවිතයේ පවතින බවත්, මුල් යුගයේ හෙවත් ක්‍රි.පූ. තෙවන සියවසේ සිට ශිලා ලේඛනවල ප්‍රමුඛ වදනක් වශයෙන් පවතින්නක් බවත් පරණවිතාන පෙන්වා දෙයි.[2] එසේම ක්‍රි.පූ. තෙවන (03) සියවසට පෙර එය හමු නොවන බව ද ඔහු කියයි.[3] මෙම වදන භාවිත වනුයේ පාලි භාෂාවේ යම් පිරිසක (සමාගමක) ප්‍රමුඛයා හඳුන්වා දීමට ය. (පාමොක්ඛ) මෙයින් අදහස් කරන්නේ ප්‍රමුඛයා නායකයා යන්න බව පොල්වත්තේ බුද්ධදත්ත හිමි පාලි සිංහල අකාරාදියේ ද දක්වයි.[4] මෙම වදන උතුරු ඉන්දියාවේ වංසවත් පවුල්වල සාමාජිකයන් හැඳින්වීම සඳහා යෙදුණකි. මෙම යුගයේ පාමොක්ඛ ශ්‍රේණියක කුමන බලයක් හෝ අධිකාරී බලයක් තිබුණේදැ යි පැවසීම අපහසු බව එඩ්වර්ඩ් රැප්සන් සඳහන් කරයි.[5] කෙසේ වෙතත් මෙරට මූල බ්‍රාහ්මීය ශිලා ලේඛනවල සඳහන් පරුමක යන්න එහි ම ප්‍රමුඛ හෝ පමුඛ යන්නෙහි භින්නාර්ථය වන අතර වංසවත් බලවන්තයන්ගේ සම්බන්ධයක් පෙනුණ ද ඔවුන් රාජ්‍යත්වය දැරුවන් නොවන බව පැහැදිලි වේ. එහෙත් ඔවුන් පැහැදිලිව ම ජනප්‍රධානීන් බව තහවුරු වෙයි. පරණවිතාන '**පරුමකවරු**' මෙරට රජ පදවිය නොදැරූ බවත්, රාජ්‍ය පදවිය දැරුවන් '**මහාපමුඛ**' යන වදන හිමි '**මපරුමුක**' යන වදනින් ශිලා ලේඛනවල හඳුන්වා ඇති බවත් පිළිගනී. එහෙත් '**පරුමකවරු**' ජනප්‍රධානින් බව පරණවිතාන ද පිළිගනී.[6]

මූල බ්‍රහ්මී ශිලා ලේඛනවල පෙනෙන පරුමකවරුන් පිළිබඳව ලක්ෂ්මන් එස්. පෙරේරා සඳහන් කරනුයේ මෙම තනතුරු නාමය ආගමික සහ සම්බන්ධතාවයක් පෙන්වන බව ය. තව ද අති විශාල පිරිසක් මූල බ්‍රාහ්මී ශිලා ලේඛනවල දිස්වෙන බැවින් ඔවුන් සමාජයේ පහළ ශ්‍රේණිවල ජනයාගේ නියෝජිත පිරිසක් බව ද ඔහු මත පළ කරයි.[7] තව ද ඔවුන් ගමිකවරුන්ට වඩා වැඩි වෙනසක් නොපෙන්වන බව ද ඔහු කියයි.[8] පෙරේරා පෙන්වා දෙන ආකාරයට පරුමකවරු රාජ්‍ය පාලනය සම්බන්ධ කාර්යය කටයුතුවල නියුක්ත වූවෝ නොවෙති. එසේ වූයේ නම් ඔවුන් රජු හා ගමික වරුන් අතරත පාලකයන් වශයෙන් සිටිය යුතුය. එහෙත් එවැන්නක් ශිලා ලේඛනවල සාධකවලින් සනාථ නොවේ.[9] මොවුන් ගමෙහි නායකයන් වශයෙන් ද පෙනී සිටි බවක් නොපෙනේ. ඔවුන් ගම් ප්‍රධානීන් වූවා නම් එකම යුගයේ ශිලාලේඛනවල පෙනෙන ගමිකවරුන්ගේ කාර්යභාරය කුමක් වූයේදැ යි විමසීමට සිදු වේ. ගමිකවරුන් සිටිද්දී ම පරුමකවරුන් සිටියේ නම් එකම පාලනය සඳහා තනතුරු ලත් දෙදෙනෙක් ක්‍රියා කිරීම ගැටලු සහගතය. තව ද ඇතැම් ශිලා ලේඛනවල මෙම තනතුරු දෙක ම ඇති පිරිස් එකට එක්ව ලෙන් පුද ඇත. කුරුණෑගල දිස්ත්‍රික්කයේ රංගිරි විහාරයේ ශිලා ලේඛනයක (952) මේ සඳහා නිදසුන් පවතී.[10] මේ පිළිබඳව දීර්ඝ කරුණු පැහැදිලි කිරීමක යෙදෙන ලක්ෂමන් එස්. පෙරේරාගේ අදහස වන්නේ මේ තුළින් ග්‍රාමීය බල අධිකාරියක් නියෝජනය කෙරෙන අතර ගෞරවණීය නායකත්වයක් සනිටුහන් වන බව ය. තව ද පරුමකවරුන් රටෙහි විවිධ ප්‍රදේශවල ශිලා ලේඛනවල දක්නට ලැබෙන බැවින් ඔවුන් ආගමික වශයෙන් ප්‍රාදේශීය හෝ ග්‍රාමීය නායකත්වයක් ප්‍රදර්ශනය කරන්නට ඇතැ යි යන්නට ද ඔහු අදහස් ඉදිරිපත් නොකරයි.[11] කෙසේ වෙතත් මෙම වදන මූල බ්‍රහ්මී ශිලා ලේඛන තුන්සිය අසූ හතරක (384) තරම් විශාල ප්‍රමාණයක හමු වේ. තව ද මෙම ශිලා ලේඛනවලින් අති බහුතරයක් ඔවුන් විසින් පූජා කළ හෝ ලෙන් පූජාවට හවුල් වී හෝ තිබේ. ඔවුන් වැව් පූජා කිරීමකට සම්බන්ධ වී ඇතත් ඒ අවස්ථා කිහිපයක දී පමණි. ඒ ගල්ගමුව ගිරිබාව වැවක් පූජා කිරීම[12] හා පුත්තලම දිස්ත්‍රිකයේ තෝනිගල ශිලා ලේඛන දෙකක පෙනෙන වැව් පූජා කිරීමක් සම්බන්ධයෙන් පමණි.[13] අන් සෑම තැනක ම ඔවුන් භික්ෂූන් උදෙසා සකස් කරන ලද ලෙන් පූජා කොට තිබේ.

ඉහත දැක් වූ ශිලා ලේඛන ප්‍රමාණයෙන් (334) පරුමකවරයෙකුගේ පුතෙකු පරුමක වශයෙන් නොහැඳින්වෙන වාර ඇත්තේ හතලිහක් (40) තරම් ප්‍රමාණයකි. මෙයින් සිව් තැනෙක (04) පුතා පරුමක වුව ද පියා පරුමක වශයෙන් සඳහන් වී නොමැත. මෙයින් ප්‍රකාශ වන්නේ මෙම තනතුරු පරපුරෙන් පරපුරට හිමිවන ලද තනතුරු බව යි. එවිට පෙරේරාගේ මතය විවාදපන්නය. මෙහි බොහෝ අවස්ථාවල පියා පරුමකවරයෙක් වන විට පුතා ද පරුමක වරයෙක් වූ බව පෙනේ. ඒ හැටියට සලකා බලන කළ පරුමකවරුන් ග්‍රාමීය හෝ ප්‍රාදේශීය වශයෙන් යම් බලාධිකාරයකට හිමිකම් කියූ පිරිසක් බව සනාථ වේ.

මේ පිළිබඳව විවරණයක යෙදෙන සී. ඩබ්ලිව්. නිකොලස් පරුමක යන නිල නාමය තරමක් දුරට පාරම්පරික නිල නාමයක් නොවන බවට විශ්වාසය පළ කරයි.[14] එහෙත් මේ පිළිබඳව විවරණයක යෙදෙන සුජාතා ගුණසේන පරුමක නම් විරුදය

දූරුවන් රාජ්‍යයේ උසස් තනතුරු දරා ඇති බැවින් එය බල රහිත නිල නාමයක් වශයෙන් සැලකීමට අකමැති වෙයි.[15] කෙසේ වෙතත් පෙරේරා දක්වන ආකාරයට මෙම නිල නාමය බලය රහිත වූවක් ලෙස සැලකීමට නොහැක්කේ එම නිලය දූරුවන් රජයේ වෙනත් උසස් නිලයන් ද දූරු බැවිනි. හම්බන්තොට සිතුල්පව්වෙන් ලැබෙන ශිලා ලිපියක පරුමක පුතාගේ පියා ගහපති නම් ඉහළ නිලයක් දූරුවෙක් වන අතර (630) අනුරාධපුර මහ ඇළගමුවෙන් ලැබෙන ශිලා ලිපියක පරුමක පුතාගේ පියා ගණකවරයෙකි. (213)[16]

මේ හැර සෙන්පතිවරුන් ද පරුමක යන නාමය දරා සිටි බව තහවුරු වෙයි. රිටිගල නාඋල්පත ශිලා ලේඛනයක මහසෙන්ගේ කාලයෙහි පරුමකවරුන් කළ ලෙන් පූජාවන් පිළිබඳව සටහන් වෙයි.[17] මේ හැර වළගම්බා මහරජුගේ භාණ්ඩාගාරිකවරයෙක් ද පරුමක විරුදය දරා තිබේ.[18] සිතුල්පව්ව ශිලා ලේඛනයකින් ඒ බව සනාථ වේ. වව්හමික නිලයන් දූරුවෙක් ද පරුමකවරයෙකු වශයෙන් කටයුතු කොට තිබේ. තව ද මිහින්තලයෙන් ලද ලෙන් ලිපියක බඩගරික පරුමක තිශ කෙනෙක් ගැන කියවේ.[19] භඩගරික හෝ බඩකරික වශයෙන් භාණ්ඩාගාරික ධුරය දරමින් කටයුතු කළ පරුමකවරු දහතුන් දෙනෙකුවත් (13) පිළිබඳව මූල බ්‍රාහ්මී ශිලා ලේඛනවලින් හමු වේ. වව්හමිකවරයෙක් කුරුණෑගල ගණේකන්ද විහාරයේ ශිලා ලේඛනයකින් හමු වේ.[20] මෙහි ''**වව්හමික**'' වශයෙන් යෙදුනේ වැව් පරිපාලකවරයෙකු හැඳින්වීමට යි.

තවත් අර්ථයකින් බලන කල ප්‍රමුඛ යන සංස්කෘත වචනය පුරාණ ඉන්දියාවේ ශ්‍රේණියක හෝ වෙළෙඳ ස්ථානයක ප්‍රධානියා හැඳින්වීමට ද යොදා තිබෙන බව තහවුරු වේ.[21] '**පමුඛ**' හා '**ජෙට්ඨක**' යන වදන් දෙක ම ශ්‍රේණියක ප්‍රධානියා යන අර්ථයෙහි වැටෙන බව තහවුරු වී තිබේ. එච්. එල්ලාවල ද එම අදහස පිළිගනී.[22] පරුමක යන වදන ස්ත්‍රී පුරුෂ දෙපක්ෂයට ම සාධාරණ සේ භාවිත වූ බව ද පිළිගන්නා එල්ලාවල පරුමකවරයෙකුගේ අභාවයෙන් පසු හිස්වූ තනතුර ඇතැම් විට භාර්යාවට හිමි වූ බවට ද අදහස් ඉදිරිපත් කොට ඇත.[23] '**නක්ෂත්‍රකරුවන්**' ද පරුමකවරුන් වශයෙන් පෙනී සිට ඇත. නක්ෂත්‍රකරුවන් බොහෝ විට උගත්කමින් යුක්ත වූවෝ වෙති. එබන්දන් ද මේ පිරිස අතර වීමෙන් පරුමකවරුන් සමාජ අයිතිවාසිකම් අතරින් ඉහළ සමාජ රාමුවක් ප්‍රදර්ශනය කළා පමණක් නොව උගත්කමින් ද ඉහළ පිරිසක් වශයෙන් කල් ගෙවූ බවට එය පැහැදිලි සාධකය කි. ''**පරුමක නකතික තිශ පුත**'' වශයෙන් එහි ටහන් වේ.[24] නක්ෂත්‍ර කටයුතු භාරව ඉන්දියාවේ සිටියෝ බ්‍රාහ්මණයෝ ය. මෙය බ්‍රාහ්මණයන්ට පමණක් සීමා වූ උසස් වෘත්තියක් ද විය. එබඳු වෘත්තියක් මෙරට පරුමකවරුන් ඉසිලීමෙන් සනාථ වන්නේ ඔවුන් සමාජයේ උතත් තනතුරු දැරුවන් වශයෙන් කටයුතු කළ බවම වේ.

පරුමක යන්න බෞද්ධ භික්ෂූන්ගේ නම්වලට මුලින් ද යෙදී ඇත. මුලගම ඇති ශිලාලේඛනයක ''**පරුමක සුමන තෙර**'' යන වදන දිස්වේ.[25] මෙයින් පෙනී යන්නේ පරුමකවරුන් හුදු ගිහියන් පමණක් නොව පැවිද්දන් වශයෙන් ද සිටි බව යි. මෙහි '**පරුමක**' යන වදන අර්ථ කිහිපයකින් ම ගත හැකි වේ. පාලි සාහිත්‍යයෙහි නිතර සඳහන් වන **සංඝී, ගණී, ගණාචරියෝ** වශයෙන් යෙදෙන යෙදුමට අනුව

විහාරස්ථානයක ''**ගණ පාමොක්ඛ**'' ආචාර්යවරයන් වහන්සේ ද මේ නමින් හැඳින්වූවා වන්නට ද බැරිකමෙක් නැත. ඒ හැරුණු විට පරුමක නිලය දැරූ පුද්ගලයන් පැවිදිව එම නිලය පැවිද්දෙන් අනතුරුව ද භාවිත කළා ද විය හැකි ය. මේ කොයි හැටි වුවත් ''**පරුමක**'' යන වදනෙහි ඇති ප්‍රමුඛත්වය මේ තුළින් සනිටුහන් වූ බව සැලකිය හැකි ය.

මීට අමතරව රාජකීය විරුදාවලියක් වශයෙන් ද පරුමක යන්න භාවිත කළ බවට ද සිතිය හැකි වේ. රිටිගල ආඬියාකන්ද විහාරයේ ඇති එක් ශිලාලිපියක ''**පරුමක අනුඩිය ලෙණෙ**'' වශයෙන් යෙදී ඇත.[26] මේ සඳහා අර්ථ දක්වන පරණවිතාන ''**පරුමක අනුඩිය නම් තැනැත්තියගේ ලෙන**'' වශයෙන් දක්වා ඇත. එහෙත් දොන් මාර්ටිනෝ ද සිල්වා වික්‍රමසිංහයන් දක්වන්නේ බල්ලාට නාග (ක්‍රි.පූ. 109-103) රජු හා ඔහුගේ බාල සොහොයුරෙක් වූ වළගම්බා මහරජුගේ (ක්‍රි.පූ. 89-77) රාජ්‍යත්වයෙන් පසු රජ පැමිණි අනුලා බිසව ම මෙහි සටහන් වනවා විය හැකි බව විශ්වාසයෙන් යුතුව කිය යි.[27] එසේ පිළිගන්නේනම් පරුමක නිලය දැරූ කාන්තාවන් ද රාජ්‍යත්වයට පත්වී ඇති බව පිළිගැනීමට සිදු වේ. කෑගල්ල දිස්ත්‍රික්කයේ දීවෙලින් ද තවත් පරුමක අනුඩිය නම් පුද්ගලයෙක් පිදූ ලෙනක් හමුවී තිබේ.[28] රිටිගල ම ඇති තවත් ශිලාලේඛන දෙකක ම **පරුමක අනුඩි** පිළිබඳව සඳහන් වෙයි. ඉන් එකක පරුමක අනුඩිට පරුමක උතිය නම් පුතෙක් සිට ඇති බව කියවේ.[29] අනෙක් ලිපියෙහි දැක්වෙන්නේ පරුමක අනුඩිට පරුමක තිශ නම් පුතෙක් සිටි බව ය.[30] මෙයින් පරුමක තිස්ස අනුලා නම් රැජිණියගේ පුත් මහාචූලි මහාතිස්ස නම් වන බව වික්‍රමසිංහගේ මතය යි.[31] මෙම තොරතුරු පිළිගනිතහොත් පරුමක යන නිලය දැරූවන් රාජ්‍යත්වයට අයිතිවාසිකම් ඇති අය බවත්, කාන්තාවන්ට ද එම නිලය සහිතව රාජ්‍ය පාලනය කිරීමේ අයිතිවාසිකම් හිමිව තිබූ බවත් පිළිගැනීමට සිදු වේ.

ග්‍රාම භෝජකවරුන් (බොජක/බොජික/බොජියහ) යන නිලයන් දැරූවන් පරුමකවරුන් වශයෙන් ද ක්‍රියා කළ බවට සාධක තිබේ. අනුරාධපුර ගල්කන්දේගම (121) මාතලේ කණ්ඩලම (860) යන ස්ථානවලින් ලද ලෙන් ලිපිවල භෝජකවරුන් එම නිලය දරමින් පරුමක නිලය ද දරා ඇති බවට සාධක තිබේ.

පරුමකවරු පිළිබඳ පර්යේෂණයක යෙදුණු සුදර්ශන් සෙනෙවිරත්න ඔවුන් සමාජයේ තීරණයක් ගත හැකි උසස් පිරිසක් ලෙස හඳුන්වා දුන්නේ ය.[32] මේ අතර පී. ගෝල්ඩ්ස්මිත් පරුමකවරුන් බ්‍රාහ්මණිකයන් බව ඒත්තු ගැන්වීමට උත්සාහ දැරී ය.[33] මේ පිළිබඳව අදහස් දැක්වූ පරණවිතාන ඔවුන් පරුමක > පමුඛ > පාමොක්ඛ > පරුමක වශයෙන් ගෙන ඔවුන් නායකයන් වශයෙන් ගෙන විශේෂ වශයෙන් ජාතකකථාවල පෙනෙන නායකයන් ලෙස හඳුන්වා දීමට උත්සාහ කළේ ය. තව ද ඔවුන් වෙළෙඳ ශ්‍රේණි ලෙස හඳුනා ගැනීමට ද අවකාශ සලසන ලදි.[34] රාදගෝවින්ද මුඛර්ජි පෙන්වා දෙන්නේ පමුඛ > ප්‍රමුඛයා යන පාලි වචනය ඉන්දියාවේ ශ්‍රේණියක හෝ වෙළෙඳ ශ්‍රේණියක ප්‍රධානියා යන අර්ථයෙන් යෙදී ඇති බව යි.[35] ඒ අර්ථයෙන් ගත් කළ ඔවුන් ධනවත් සමාජ වරප්‍රසාද හිමි පිරිසක් බව පැහැදිලි වේ. එහෙත් සුදර්ශන් සෙනෙවිරත්න, පරණවිතානයන් දැක්වූ ලෙස පරුමකවරුන් මූල ඓතිහාසික

යුගයේ දී ආර්ථිකය මෙහෙයවන්නන් වශයෙන් පෙනී සිටීම හා ඒ ආශ්‍රයෙන් ''ශ්‍රේණි'' නායකයන් වශයෙන් හඳුන්වා දීමට අනුකූලතාවය නොදක්ව යි.[36] ඔවුන් ක්‍රි.පූ. 06 වැනි සියවසේ එලෙස මෙරට ශ්‍රේණි කණ්ඩායම් ක්‍රියාත්මක වූ බවට ගෙන එන මතය බෙහෙවින් විවාදාපන්න බව ඔහු සඳහන් කරයි.[37] මේ සඳහා හේතු කාරක වූයේ පරණවිතානයන්ගේ **Inscriptions of Ceylon, Volume I** හි සඳහන් කදුරුවැවින් සොයාගත් ශිලාලේඛනයකි.[38] එහි ''**ගොට කබොජියන පරුමක ගොපලහ බරිය උපශික චිතය ලෙනෙ ශගශ**'' වශයෙන් සඳහන් වෙයි. එයින් පරුමක ගෝපාලගේ භාර්යාව වූ උපාශිකා චිත්තා විසින් මේ ලෙණ සකස් කොට පිදූ බවත්, ඇය කාම්බෝජ සංස්ථාවේ ප්‍රධානියා වූ පරුමක ගෝපාලගේ භාර්යාව වූ බවත් ප්‍රකාශ වේ. මෙය පරුමකවරුන් සංස්ථාපිත කණ්ඩායම්හි නායකයන් බව හැඟවීමට බොහෝ පර්යේෂකයන් උත්සාහ ගෙන ඇති බව පැහැදිලි වේ. එම අර්ථය පමණක් '**පරුමක**' යන වදනෙහි ඇතැ යි පිළිගැනීමට මේ සාධකය පමණක් ප්‍රමාණවත් නොවන බව කරුණු විමර්ශනය කිරීමේ දී හැඟී යයි. සුදර්ශන් සෙනෙවිරත්න තර්ක කරනුයේ මේ සාධකය පදනම් කරගෙන සංස්ථාපිත පරිපාලන රටාවක ඔවුන් ක්‍රියාත්මක වූ බව පිළිගැනීමට සාධක මඳ බව යි. තව ද එලෙස සංස්ථාපිත පාලන රටාවක් ක්‍රි.ව. පළමුවැනි සියවසින් එපිට මෙරට ක්‍රියාත්මක වූ බවට පිළිගත නොහැකි බව ද ඔහු වැඩිදුරටත් පෙන්වා දෙයි.[39]

දකුණු ඉන්දීය සන්ගම් සාහිත්‍යයේ පෙණෙන ආකාරයට '**පරුමකන්**' යන වදන හා ශ්‍රී ලාංකේය මූල බ්‍රාහ්මී අභිලේඛනයන්හි සඳහන් '**පරුමක**' යන වදන හා සමීප සම්බන්ධයක් ඇතැ යි එච්. සී. පී. බෙල් සිය කෑගල්ල වාර්තාවෙහි අධෝ ලිපි යටතේ සඳහන් කරයි. **පරුමකන්** යන්නෙන් අදහස් කරන්නේ රාජ කුමාරයා හෝ ගෞරවණීය පුද්ගලයාය යි ඔහු සඳහන් කර යි.[40] එහෙත් පරණවිතාන මේ මතය ප්‍රතික්ෂේප කර යි.[41] දකුණු ඉන්දීය ද්‍රවිඩ භාෂා පවුලට සම්බන්ධතාවයක් ප්‍රකට කෙරෙන ''**පරුමකන්**'' යන්න උරුමයෙන් පැවත එන ප්‍රධානියා හෙවත් ප්‍රධානත්වය පිළිබඳව කියවෙන අදහසට සුදර්ශන් සෙනෙවිරත්න අනුකූලතාවක් දක්ව යි.[42] තව ද යකඩ යුගයේ මෙගලිතික සොහොන් ගැබ්හි වැසුම් පියනේ ශිලා මතුපිට ඇති ලාංඡන හා කළු රතු මැටි බඳුන්වල (BRW) දෙරටෙහි ඇති සංකේත ආශ්‍රයෙන් මෙම මතය ගෙන එන ඔහු ඒ තුළින් ද්‍රවිඩ පරුමකන් යන වදනින් භින්නව ශ්‍රී ලංකාවේ ''පරුමක'' වශයෙන් භාවිතවූයේ නම් ඉන් ඉන්දියාවේ දකුණු ප්‍රදේශය හා පැවති දේශපාලනික හා ආර්ථික තොරතුරු කියවෙන බව ඔහු පෙන්වා දෙයි. එබැවින් එම පරුමක යන වදනින් දකුණු ඉන්දියාව හා පැවති තාක්ෂණික හා සංස්කෘතික සබඳතාවක් ප්‍රකට කරන්නේයැ යි ඔහු මත පළ කර යි.[43] තව ද ප්‍රත්‍යේක අධ්‍යයනයක් (Case Study) මගින් කරුණු පෙන්වා දෙන ඔහු ඒ සඳහා මෙරට පරුමකවරුන්ගේ ව්‍යාප්තිය විමර්ශනයට බඳුන් කරයි.[44] ඔහු දක්වන ආකාරයට ක්‍රි.පූ. 06/07 සියවස්හි ලංකාව, දකුණු ඉන්දියාව හා සන්සරණය වී ඇති ජාතකකථාවල ප්‍රමුඛයන් පරුමකයන් වශයෙන් සලකා ඇති බව ද ඔහු පෙන්වා දෙයි.[45] තව ද පරුමකවරුන් මෙරට සිටි ධනවත් හා බලවත් පිරිසක් බව ද ඔහු පිළිගනියි.[46]

පරුමක තිලය කාන්තාවක විසින් දරනු ලබන අවස්ථාවේ දී ඇය ''පරුමකලු'' හෝ ''පරුමකල'' යන වදන්වලින් හඳුන්වා තිබේ. එබඳු ශිලා ලේඛන හයක් (06)

මූල බ්‍රාහ්මී ශිලා ලේඛන අතරෙහි වෙයි. අනුරාධපුර බ්‍රාහ්මණයාගම (143) රිටිගල මරක්කල උල්පත (260) වව්නියාව එරුපොතාන (331) හම්බන්තොට සිතුල්පව්ව (610)[47] අම්පාර පියන්ගල[48] රත්නපුර ඉඳුරුගගයාය[49] වශයෙන් එම ශිලා ලේඛන හඳුනාගත හැකිය. මෙමගින් ප්‍රකාශ වන්නේ පරුමක යන නිලය හුදෙක් පුරුෂ පක්ෂය සඳහා තහවුරු වූ නිලයක් පමණක් නොව එය ස්ත්‍රී පක්ෂය සඳහා ද භාවිත වූ නිලයක් වශයෙන් ක්‍රියාත්මකව පැවැති බව යි. මේ පිළිබඳව සී. ඩබ්ලිව්. නිකොලස් දක්වන මතය වන්නේ පරුමකවරු ප්‍රාදේශීය අධිකරණ හෝ නිලධාරී බලයක් හෝ සමාජයේ අධිකාරී බලයක් නොදරන ලද මුත් ඔවුන් සමාජයෙහි තත්ත්වයෙන් උසස් අය ලෙස ක්‍රියාත්මක වූ පිරිසක් බව යි.

## නිගමනය

පරුමකවරුන් පිළිබඳ උගතුන් රාශියක් විවිධ මත එළි දක්වා තිබේ. ඒ සෑම අදහසක ම අවසන් වශයෙන් පරුමකවරුන් යම් බලයක් සහිතව සිටි ගමක හෝ ප්‍රදේශයක ප්‍රභූන් පිරිසක් බව සනාථ වේ. තව ද ඔවුන් රජු හා ළඟින් ඇසුරු කරමින් ප්‍රාදේශීය පාලනයෙහි යෙදී ඇති සැටියක් ද පසක් වේ. මෙම වදන පැමිණි ආකාරය පිළිබඳ විමර්ශනය හා එයින් යම් නිගමනයකට එළඹීම එතරම් පහසු කටයුත්තක් නොවේ. ඒ එම නිලය සමාජයේ ප්‍රභූත්වය හා බැඳි නිලයක් වශයෙන් පෙණෙන මුත් පරිපාලන නිලයක් වශයෙන් ඍජු සම්බන්ධයක් නොපෙන්වන බැවිනි. එහෙත් පරිපාලන කාර්යයන්වලට හවුල්වීමක් තිබූ බවට සිතීමට කරුණු තිබේ. පරුමක නිල නාමය තිබූවන්ගේ දූ දරුවන්ට ඇතැම් විට පරුමක ධුරය හිමි නොවුන අතර ඇතැම් පරුමක නිල නාමය නොතිබූවන්ට පරුමක ධුරය හිමි වූ බවට සාධක පැවැතීමෙන් පෙනීයන්නේ මෙම නිලය පාරම්පරික වශයෙන් ආ අධිකාරි බලය සහිත නිලයක් වශයෙන් සැලකීමට අවශ්‍යතාවක් නොමැති බව යි. එහෙත් බහුල වශයෙන් ම මෙම නිලය පරම්පරාවෙන් ආ බවට සාධක බහුලය. කෙසේ වෙතත් පරුමකවරු එම නිලයට අමතරව තවත් විවිධ නිලයන් ද දරා ඇති බවට සාධක දිස්වන බැවින් ඔවුන් සමාජයේ බලාධිකාරයක් හිමි පාලන කාර්යයට ඍජුවම හෝ වක්‍රව සම්බන්ධ වූ ප්‍රභූන් පිරිසක් වශයෙන් හඳුනාගැනීමට මූල බ්‍රාහ්මී ශිලා ලේඛනවලින් කොතෙකුත් අවකාශ සැලසේ.

### ආන්තික සටහන්

01. Paranavitana S., *Epigraphia Zeylanica*, Volume V, Part 3, Archaeological Department, Ceylon,1936: p. 447
02. -ibid-
03. -ibid-
04. බුද්ධදත්ත හිමි පොල්වත්තේ, *පාලි සිංහල අකාරාදිය*, බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය, නැදිමාල දෙහිවල: 1998, 337
05. Rapson, E. J. *The Cambridge History of India, Volume I.* Ancient India. Cambridge: University Press, 1922. p. 206

06. Paranavitana S, *Inscriptions of Ceylon, Volume I*, Archaeological Survey Department of Sri Lanka, Colombo: 1970: p. xxiv

07. Perera, L. S., *The Institutions of Ancient Ceylon from Inscriptions*, University of Peradeniya, 2001, p. 57

08. -ibid-

09. -ibid-

10. Paranavitana S, *Inscriptions of Ceylon, Volume I*, Archaeological Survey Department of Sri Lanka, Colombo: 1970: p. 74

11. Perera, L. S., *The Institutions of Ancient Ceylon from Inscriptions*, University of Peradeniya, 2001, 60

12. Paranavitana S, *Inscriptions of Ceylon, Volume I*, Archaeological Survey Department of Sri Lanka, Colombo: 1970: p. 99

13. -ibid-: p. 82

14. නිකොලස් සී. ඩබ්. *ආදි සිංහල රාජ්‍යයේ බ්‍රාහ්මණයෝ, ලංකා ඉතිහාසය 1.* සාහිත්‍ය මණ්ඩලීය ලිපි මාලා, ශ්‍රී ලංකා සාහිත්‍ය මණ්ඩලය, කොළඹ: 1967: පි. 189

15. Gunasena Sujatha, *Kingship in Ceylon From the Forth to Ten Century* A.D. Thesis Submitted for the Doctoral of Phycology, University of London: 1974: p. 43-47

16. Paranavitana S, *Inscriptions of Ceylon, Volume I*, Archaeological Survey Department of Sri Lanka, Colombo: 1970: p. 17

17. -ibid-

18. -ibid- p. 47

19. -ibid- p. 01

20. -ibid- p. 97

21. Mookerji, R., *Local Government in Ancient India*, Oxford at the Clarendon Press, 1919: p. 47

22. එල්ලාවල එච්., *පුරාණ ලංකාවේ සමාජ ඉතිහාසය*, සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව, 1964: පි. 35

23. -එම-: පි. 36

24. Paranavitana S, *Inscriptions of Ceylon, Volume I*, Archaeological Survey Department of Sri Lanka, Colombo: 1970: p. 73

25. Muller,E., *Ancient Inscriptions of Ceylon*, Trubner &Co., Ludagate Hall, London: 1883: p. 48

26. Paranavitana S, *Inscriptions of Ceylon, Volume I*, Archaeological Survey Department of Sri Lanka, Colombo: 1970: p. 19

27. Wickramasinghe, Don M.S., *Epigraphia Zeylanica*, Published for the Government of Ceylon by Henry Frowde Oxford University Press, London: 1912: p. 143

28. Paranavitana S, *Inscriptions of Ceylon, Volume I*, Archaeological Survey Department of Sri Lanka, Colombo: 1970: p. 61

29. -ibid-: p. 19
30. -ibid-: p. 20
31. Wickramasinghe, Don M.S., *Epigraphia Zeylanica*, Published for the Government of Ceylon by Henry Frowde Oxford University Press, London: 1912: p. 143
32. Seneviratna S., *"Pre State Chieftains and Servants of the State – A Case Study of Parumaka",* Sri Lanka Journal of Humanities, Vol. xv (Nos. 1&2) 1992, p. 102
33. Goldschmidtt P., *"Notes on Ancient Sinhalese Inscriptions"*. Journal of the Royal Asiatic Society, Ceylon Branch, Vol. 6, 1979, p. 2
34. Puranavitana S. , *" Sinhalese and Origin of Kingshlp"*, Journal of the Royal Asiatic Society, Great Britten and Ireland, 1936: p. 447-449
35. Mookerji R., *Local Government in Ancient India*, Oxford at the Clarndon Press, 1919, p. 47
36. Seneviratna S., *"Pre State Chieftains and Servants of the State – A Case Study of Parumaka"*, Sri Lanka Journal of Humanities, Vol. xv (Nos. 1&2) 1992, p. 102
37. -ibid-
38. Paranavitana S, *Inscriptions of Ceylon, Volume I*, Archaeological Survey Department of Sri Lanka, Colombo: 1970: p. 77
39. Paranavitana S, *Inscriptions of Ceylon, Volume I*, Archaeological Survey Department of Sri Lanka, Colombo: 1970: p. 61
40. Bell, H. C. P. – *The Report of the Kegalla District*, Colombo: Archaeological Survey of Ceylon, 1892. p. 69.
41. Paranavitana S, *Inscriptions of Ceylon, Volume I*, Archaeological Survey Department of Sri Lanka, Colombo: 1970: p. lxxiv
42. Seneviratna S., *"Pre State Chieftains and Servants of the State – A Case Study of Parumaka"*, Sri Lanka Journal of Humanities, Vol. xv (Nos. 1&2) 1992, p. 105
43. -ibid-: p. 109
44. -ibid-: p. 113
45. -ibid-
46. -ibid- p. 115
47. Paranavitana S, *Inscriptions of Ceylon, Volume I*, Archaeological Survey Department of Sri Lanka, Colombo: 1970: Number Mentioned Inscriptions
48. මේධානන්ද හිමි එල්ලාවල, *රෝහණයේ අප්‍රකට ශිලාලිපි*, සී/ස දයාවංශ ජයකොඩි සහ සමාගම, 2012, 14 වැනි ශිලාලිපිය
49. -එම- පි. 154/01